# ඒකාබද්ධ වෘත්තීයවේදීන්ගේ ව්‍යාපාරය
# මාධ්‍ය නිවේදනය

## *2015 නොවැම්බර මස 9 වනදා*

අපගේ මව්බිමේ අනාගත ප්‍රගමණය සඳහා අවශ්‍ය ප්‍රාධානතම දායකත්වය ලබාදෙනුයේ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත සංගම් හා ව්‍යාපාරයන්ය. රටේ විද්වතුන්ගෙන් සැදුම්ලත් වෘත්තියවේදීන්, රටේ අනාගත ආර්ථික දියුණුව ලඟා කර ගැනීමේ අරමුණින් සම්පාදනය වන ප්‍රතිපත්ති සෑදීමේ කටයුත්තට එක් කර නොගැනීම නිසා රටට අහිතකර තීන්දු තීරණ ගන්නා බව පෙනී යයි.

රටේ අනාගතයට හා ජනතාවට වගකිව යුතු විදුවතුන් ලෙස රටේ අනාගත ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට අවැසි සහය ලබා දෙමින්, රට යහපත් දිසානතියකට යොමු කිරීමේ ගමන් මග පෙන්වීම අපගේ එකමුතුවේ මුලික අරමුණයි.

යහපාලන සම්මුතිවාදි දේශපාලනය තේමා කරගත් අවදියක අපගේ අතිගරු ජනාධිපති තුමා හා ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් විද්වතුන්ගේ හා බුදධිමතුන්ගේ අදහස් වලට ධනාත්මක ප්‍රතිචාරයක් අප බලාපොරොත්තු වෙමු.

ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට ශ්‍රී ලාංකීය වෘත්තීයවේදීන්ගෙන් සැදුම්ලත් සියලු සංගම් හා ව්‍යාපාර එක්ව මෙම "ඒකාබද්ධ වෘත්තිකයන්ගේ ව්‍යාපාරය" පිහිටුවන ලදි.

***අපගේ එකමුතුව***

1. ශ්‍රී ලංකා ඉංජිනේරු සංගමය
2. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
3. රජයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමය
4. ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනය
5. ව්‍යාවස්ථාපිත ඉංජිනේරුවන්ගේ ආයතනය
6. ශ්‍රී ලංකා පරිගණක සංගමය
7. මානව සම්පත් කළමණාකරණ ආයතනය
8. ශ්‍රී ලංකා නීතීඥවරුන්ගේ සංගමය
9. ශ්‍රී ලංකා ගෘහ නිර්මාණශිල්පීන්ගේ ආයතනය
10. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරණ කළමානාකරණ ආයතනය
11. ශ්‍රී ලංකා ව්‍යවහාර සංඛ්‍යාලේඛන ආයතනය

***අපගේ මුලික අරමුණ,***

1. "ඒකාබද්ධ වෘත්තිකයන්ගේ ව්‍යාපාරය" ලෙස විද්වත් මතය රජයට ලබා දීමේ අරමුණින් අතිගරු මෛත්‍රිපාල සිරිසේන, ජනාධිපතිතුමාගෙන් හා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ හමුවක් ප්‍රථමයෙන් අප ලිඛිතව ඉල්ලා සිටිමු.
2. ආර්ථික , වෙළඳ, සෞඛ්‍ය , අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන හා අන්තර් ජාතික ගවිසුම් වලදී ජාතික අවශ්‍යතාවක් ලෙස සලකා රටේ වෘත්තීයවේදීන් ලෙස ප්‍රතිපත්ති සම්පාදනයට සක්‍රිය දායකත්වය ලබා දීම
3. දැනට අසාර්ථක වු ද්විපාර්ශවික අන්තර් ජාතික ගිවිසුම් මෙන්ම, දැනට රජය ජපානය, ඉන්දියාව, බංගලිදේශය, සිංගප්පුරුව, සමග ගෙන යන ද්වීපාර්ශවික සාකච්ඡා , රටේ යහපත සඳහා වෙනස් කර ගැනීම සඳහා අවශ්‍ය උපදේශන හා ක්‍රමවේදයන් රජය වෙනුවෙන් සැකසීම.

"ඒකාබද්ධ වෘත්තිකයන්ගේ ව්‍යාපාරය" ලෙස අපගේ නිදහස් මතය හා ඉල්ලීම වනුයේ භාණ්ඩ වෙළඳාම හා සේවා වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික ද්වීපාර්වික ගිවිසුම් සැකසීමේදි අදාල වෘත්තීය නියෝජිතයින් සමග මීට වඩා විනිවිදභාවයකින් යුතුව සාකච්ඡා කර, ශ්‍රී ලාංකීය උත්තරීතර පාර්ලිමේන්තුවේදි නිවැරදිව සම්මතකර, ශ්‍රී ලංකාවේ සමාජීය, පාරසරික, ජාතික ආරක්ෂාව, රැකියා උත්පාදනය, ආර්ථික හා වෙළඳාම සඳහා උපරිම වාසියක් වන අයුරින් සකසන ලෙසය.

වැඩිදුර විස්තර


ඉංජිනේරු පාලිත අබේවර්ධන,- සභාපති , ශ්‍රී ලංකා ඉංජිනේරු සංගමය-
0773895096,slea@engineers.lk

වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය-
0772604208,senalfernando1984@gmail.com